විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 04/2021

මගේ අංක : විවැ/චක්‍රලේඛ 2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10
2021.11.05

අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන් හා

ප්‍රාදේශීය ලේකම්වරුන්

**විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වූ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීම.**

2021.10.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (VIII) සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයෙන් විශ්‍රාමිකයින් සඳහා ක්‍රියාත්මක කරන ලද අග්‍රහාර රැකවරණ රක්ෂණ ක්‍රමය 2016.01.01 දිනට පෙර විශ්‍රාම ලැබූ සියලුම නිලධාරීන්ට ද ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි පුළුල් කර ඇත.

02. 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා නිලධාරීන් සඳහා 2005 අයවැයෙන් යෝජිත පරිදි "නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)" යන මැයෙන් මවිසින් නිකුත් කරන ලද 2016.05.31 දිනැති 4/2016 හා 2017.11.24 දිනැති 4/2016(I) චක්‍රලේඛ විධිවිධාන 2021.11.01 දින සිට අහෝසි කරන අතර, එදින සිට මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලපැවැත් වේ.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VIII) හි ඇමුණුම 01 හි දක්වා ඇති කොන්දේසිවලට යටත්ව එහි ඇමුණුම 02 හි ප්‍රතිලාභ, නව අග්‍රහාර රැකවරණ රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ලැබෙනු ඇත. (මෙම චක්‍රලේඛයේ ඇමුණුම් - 01 යටතේ දක්වා ඇත.)

II. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් ඇති සියලුම විශ්‍රාමිකයින් මෙම රක්ෂණ ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව දායක වන සියලුම විශ්‍රාමිකයින්ට ජීවිතාන්තය දක්වා රක්ෂණ ප්‍රතිලාභ ලැබිය හැක.

III. නව ක්‍රමය යටතේ, වයස අවුරුදු 70ට අඩු විශ්‍රාමිකයකුගෙන් රු. 400ක මාසික වාරික මුදලක් ද, අවුරුදු 70ට වැඩි විශ්‍රාමිකයකුගෙන් රු. 600ක මාසික වාරික මුදලක් ද, අය කරනු ලැබේ.

IV. මෙම යෝජනා ක්‍රමයට දායක වීමට අකමැති විශ්‍රාමිකයෙක් වේ නම්, ඔවුන්ට පහත ක්‍රමවලින් එක් ආකාරයකට ඒ බව 2021.11.15 දිනට පෙර දැන්විය යුතු ය.

a. ඇමුණුම 02 යටතේ දක්වා ඇති ආකෘතිය සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හෝ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට භාර දීම. ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් විසින් එම තොරතුරු මධ්‍යගත දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතු ය.

b. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.pensions.gov.lk වෙත පිවිස එහි public services යටතේ දක්වා ඇති මනාප ප්‍රකාශ කිරීමේ ක්‍රමය භාවිතා කිරීම.
සැ.යු. - මේ සඳහා විශ්‍රාමිකයාගේ ජංගම දුරකතන අංකය වෙත OTP අංකයක් යොමු වන අතර අදාල දැනුම් දීම සිදු කිරීමේ දී එය භාවිතා කළ යුතු ය.

c. සුදුසුකම් ලබන විශ්‍රාමිකයන් වෙත යොමු කරන කෙටි පණිවුඩයට අනුව අග්‍රහාර රක්ෂණ ක්‍රමයට මනාපය පල කිරීමට අකමැති නම් No ලෙස ඇතුළත් කර පිළිතුරු එවීම.

V. විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ගේ වාරික මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අය කර මාසිකව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

03. ඉහත 2 (II) හි සඳහන් විශ්‍රාමිකයින්ට පමණක් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමි වන අතර, ඔවුන්ගේ කලත්‍රයාට, අනත්දරුවාට හෝ ආබාධිත දරුවන්ට ප්‍රතිලාභ හිමි නොවේ.

04. ජාතික රක්ෂණ භාර අරමුදල මගින් හඳුන්වා දී ඇති අයදුම් පත්‍රය (ඇමුණුම 03) මෙම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමිකයින් විසින් තම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා භාවිතා කළ යුතු අතර, එය ග්‍රාම නිලධාරී මඟින් තහවුරු කර සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතු ය.

05. විදේශගත වූ විශ්‍රාමිකයින් සඳහා ද මෙම ක්‍රමයේ දායකත්වය මත ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වේ. විදේශගත විශ්‍රාමිකයා තම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අදාළ ලියකියවිලි අදාළ විදේශ රටෙහි තානාපති කාර්යාලය හරහා තහවුරු කර ජාතික රක්ෂණභාර අරමුදල වෙත ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

07. ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්ට අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ අඩු කිරීම් පිළිබඳ තොරතුරු මධ්‍යම දත්ත පද්ධතියේ pension menu ———> pension payments ———> pension information තුළින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තොරතුරු ලබා ගත හැකි වේ. එසේම විශ්‍රාමිකයින් හට දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.pensions.gov.lk) තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් (Public services) ඔස්සේ ඔවුන්ගේ අග්‍රහාර අඩු කිරීම් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ය.

08. විශ්‍රාමිකයින් සඳහා සාමාජික කාඩ්පතක් නිකුත් කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කටයුතු කරනු ඇත.

09. අග්‍රහාර රකවරණ රක්ෂණ ක්‍රමයේ වැඩිදුර විස්තර සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ පහත සඳහන් නිලධාරීයා විමසීම මැනවි.

| | | |
|---|---|---|
| නම | - | නිමේෂා සහබන්දු මහත්මිය |
| තනතුරු | - | සහකාර කළමනාකරු<br>අග්‍රහාර (විශ්‍රාමික) රක්ෂණ |
| විමසීම | - | 0112026668 |

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 03. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 04. | ලේකම්, රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 05. | සභාපති, ජාතික රක්ෂණ භාර අරමුදල | - අ.කා.ස |
| 06. | විගණකාධිපති | - අ.කා.ස |

**ඇමුණුම 01**

**2021.06.01 දිනට සංශෝධිත අග්‍රහාර රකවරණ විශ්‍රාමික රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ සටහන**

**(අ) ජීවිත කාලය තුළ සාමාන්‍ය ලෙස ලබා ගත හැකි ප්‍රතිලාභ**

| අනු අංකය | ප්‍රතිලාභ වගර් හා වටිනාකම (රුපියල්) | උපරිම වටිනාකම (රුපියල්) |
|---|---|---|
| 01 | **පුද්ගලික රෝහලක නේවාසික ව ප්‍රතිකාර ලබා ගැනීමේ දී**<br>• කාමර ගාස්තු සඳහා රු.30,000/-<br>(දිනකට රු.3,000/- බැගින් උපරිම දින 10ක් සඳහා)<br>• ඖෂධ, ශල්‍ය හා හෙද වියදම් රු.50,000/-<br>• වෛද්‍ය ගාස්තු රු.20,000/-<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා රු.20,000/- | 120,000/-<br>(එක් සිද්ධියක් සඳහා) |
| 02 | **පුද්ගලික ආයුවෙර්ද රෝහලක ප්‍රතිකාර සඳහා**<br>• කාමර ගාස්තු සඳහා රු. 10,000/-<br>(දිනකට රු.1,000/- බැගින් උපරිම දින 10ක් සඳහා )<br>• ඖෂධ, ශල්‍ය හා හෙද වියදම් රු. 35,000/-<br>• වෛද්‍ය ගාස්තු රු.15,000/-<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා රු.15,000/-<br>(පුද්ගලික ආයුවෙර්ද රෝහල,දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී තිබිය යුතු ය. පුද්ගලික ආයුවෙර්ද මද්‍යස්ථානවලින් ගන්නා ප්‍රතිකාර සඳහා ගෙවීම් කරනු නොලැබේ. ) | 75,000/-<br>(වාෂරීකයට යටත්ව) |
| 03 | **(අ) රජයේ රෝහල් සඳහා**<br>රජයේ රෝහලක නේවාසික ව ප්‍රතිකාර ලබන්නේ නම් (වරකට උපරිම දින 10ක් සඳහා දිනකට රු.500/- බැගින් වසරකට උපරිම දින 20ක් සඳහා පමණි.)<br>• ඖෂධ වියදම්<br>• වෛද්‍ය පරීක්ෂණ සඳහා<br>(නේවාසිකව සිටි කාල පරිච්ඡේදයට අදාල ව පමණක් බිල්පත් ප්‍රතිපූරණය කරනු ලබන අතර, ඒ සඳහා වෛද්‍ය නිදෙර්ශ හා බිල්පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)<br>**(ආ) රජයේ රෝහලේ (ගෙවන වාට්ටු සඳහා)**<br>• කාමර ගාස්තු රු.10,000/-<br>(දිනකට රු.1,000/- බැගින් උපරිම දින 10ක් සඳහා)<br>• ඖෂධ, ශල්‍ය හා හෙද වියදම් රු.35,000/-<br>• වෛද්‍ය ගාස්තු රු.15,000/-<br>• වෛද්‍ය පරීක්ෂණය සඳහා රු. 15,000/- | 5,000/-<br>50,000/-<br>20,000/-<br>75,000/-<br>(එක් සිද්ධියක් සඳහා) |

අ.පි.බ

| | | |
|---|---|---|
| **04** | **රජයේ ආයුවේදි රෝහලක ප්‍රතිකාර සඳහා**<br>රජයේ ආයුවේදි රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන්නේ නම් (දිනකට රු.500/- බැගින් උපරිම දින 10ක් සඳහා )<br>(වසරකට උපරිම දින 20ක් සඳහා පමණි.) | 5,000/- |
| **05** | ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍ය කමර්ය<br>(කාච සඳහා වන වියදම් ද ඇතුළත් ව) | 25,000/- |

සටහන : ඉහත 01 සිට 05 දක්වා වූ සිදුවීම්වලට අදාල උපරිම සීමාවන්ට යටත් ව රක්ෂණ සාමාජිකයාගේ හිමිකම් සීමාව වසරකට උපරිමය රු. 150,000/- ක් වේ.

**(ආ) ජීවිත කාලය තුළ එක් වරක් පමණක් ප්‍රති පූරණය කළ හැකි විශේෂ ප්‍රතිලාභ පහත සඳහන් පරිදි වේ.**

| අනු අංකය | ප්‍රතිලාභ වගර්ය | උපරිම වටිනාකම (රුපියල්) |
|---|---|---|
| **01** | • Critical Heart Surgeries (including by-pass and angioplasty) හෘදය ආශ්‍රිත වෙනත් සැත්කම්<br>• Implanting pacemaker – Single<br>• Implanting pacemaker – Double<br>• RF Ablation | 500,000/-<br>150,000/-<br>300,000/-<br>225,000/- |
| **02** | වකුගඩු බද්ධ කිරීම සඳහා | 500,000/- |
| **03** | මොළයේ ශල්‍යකමර් සඳහා | 500,000/- |
| **04** | අක්මාව බද්ධ කිරීමේ ශල්‍යකමර්ය සඳහා | 500,000/- |
| | පුද්ගලික රෝහලක සිදුකරනු ලබන හෘද, වකුගඩු, මොළය හා අක්මාව ආශ්‍රිත සැත්කම් සඳහා වන වියදම් ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් සෘජුව ම රෝහල වෙත ගෙවිය හැක. එවැනි අවස්ථාවක රෝහල් ගතවීමට පෙර ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ඇප ආවරණ ලිපියක් ලබාගත යුතු වේ.<br>ඉහත සඳහන් ශල්‍යකමර් හැර පෞද්ගලික රෝහලක සිදු කරනු ලබන වෙනත් ශල්‍යකමර් සඳහා වන වියදම් ගෙවීම ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයේ සඳහන් අංක 01 අනුව ප්‍රතිපූරණය කරනු ලැබේ. | |
| **05** | පිළිකා රෝග සඳහා | 200,000/- |
| **06** | ශ්‍රවණ උපකරණ සඳහා (ජීවිත කාලය තුළ එක් වරක් පමණි.) | 50,000/- |

ඇමුණුම 02

අග්‍රහාර රැකවරණ රක්ෂණ ක්‍රමයට දායක වීමට අකමැත්ත පළ කිරීම

| ජාතික හැඳුනුම්පත් අංකය | විශ්‍රාම වැටුප් අංකය | නම |
|---|---|---|
| | | |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005(VIII) මඟින් යෝජනා කර ඇති අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා දායක වීමට අකමැති බව කාරුණිකව දන්වමි.

.........................................
විශ්‍රාමිකයාගේ අත්සන

............................
දිනය

ඇමුණුම 03

# ජාතික රක්ෂණ භාර අරමුදල

## වෛද්‍ය හා රෝහල් ගාස්තු හිමිකම් ඉල්ලුම් පත්‍රය
## අග්‍රහාර රැකවරණ රක්ෂණ යෝජනා ක්‍රමය. (විශ්‍රාමික)

දැනුම් දීමට අවශ්‍ය
කෙටි පණිවුඩ (SMS) ☐ හෝ
තැපැල් ☐
(අවශ්‍ය මාධ්‍යය ලකුණු කරන්න)

| ඔබගේ හිමිකම අදාල වන්නේ ඉදිරියෙන් ( ✓ ) දමන්න. | | |
|---|---|---|
| වෙනත් රෝග මත | රජයේ රෝහල් ගතවීම | |
| | පෞද්ගලික රෝහල් ගතවීම | |
| හෘද සැත්කමක් | | |
| පිළිකා රෝග | | |
| වකුගඩු රෝග | | |

ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය
(ඡායා පිටපත අමුණන්න)

විශ්‍රාම වැටුප් අංකය

1. ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරුඃ-

1.1 සම්පූර්ණ නමඃ- (සිංහලෙන්) පූජ්‍ය / මයා / මිය / මෙනෙවිය

..........................................................................................................

මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්)...................................................................

1.2 පුද්ගලික ලිපිනය : (සිංහලෙන්)ඃ-.................................................................

1.2 පුද්ගලික ලිපිනය (ඉංග්‍රීසියෙන්)..................................................................

1.3 උපන් දිනයඃ- ..................................................

1.4 දුරකථන අංකය :- නිවස.................................. ජංගමඃ..........................................

2. ඔබ රැකියාව කරන ලද ආයතනයේ නම සහ ලිපිනය...........................................................

..........................................................................................................................

3. කලත්‍රයාගේ තොරතුරු

3.1 ජාතික හැඳුනුම්පත් අංකය

3.2 නමඃ......................................................................................

3.3 සේවා ස්ථානයේ නම සහ ලිපිනයඃ..........................................................

..........................................................................................................

4. බැංකු ගිණුම් පිලිබඳ විස්තරයඃ-

4.1 බැංකු ගිණුමෙ සඳහන් ඔබගේ නමඃ...................................................................

4.2 ගිණුම් අංකය

4.3 බැංකුවේ නමඃ........................................ බැංකු ශාඛාවඃ..........................................

5. මෙම අයදුම් පතට අදාල වියදම් ජනාධිපති අරමුදලෙන් හෝ වෙනත් ආයතනයකින් ඉල්ලුම්කර හෝ ගෙවීම් කර තිබේ නම් එම විස්තර.

5.1 ආයතනයේ නම සහ ලිපිනයඃ.............................................................

..........................................................................................................

5.2 ගෙවූ මුදලඃ.................................................................................

5.3 හිමිකම් අංකය / යොමු අංකයඃ.........................................................

6. අයදුම්කරුගේ ප්‍රකාශය
ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මම හෝ මගේ කලත්‍රයා මෙම හිමිකම්පෑම ඉහත 05 ඡේදයට යටත්ව වෙනත් ආයතනයකින්, වෙනත් ක්‍රමයක් මගින් හෝ ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර හෝ නොමැති බව මම මෙයින් සහතික වෙමි.

දිනයඃ-.......................................

..............................................
අයදුම්කරුගේ අත්සන

7. ග්‍රාම නිළධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය. (අනවශ්‍ය වචන කපා හරින්න.)

ඉහත විස්තර සඳහන් ........................................................................................................ මහතා/ මහත්මියගේ රෝහල් ගතවීම පිළිබඳ ලිපි ලේඛන සත්‍ය හා නිවැරදිබවත් ඔහුගේ / ඇයගේ රක්ෂණ හිමිකම අවශ්‍ය කටයුතු සඳහා නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

අත්සන:...................................................

නම:.......................................................

ග්‍රාම නිළධාරි වසම / අංකය:....................

දිනය:...................................................

(නිල මුද්‍රාව තැබීම අත්‍යවශ්‍යයි)

## අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු ලිපි ලේඛණ

01. රෝග නිශ්චය කාඩ්පතෙහි සහතික කල පිටපත
(රෝගියාගේ නම, රෝහලට ඇතුලත් වූ දිනය හා රෝහලින් බැහැරවූ දිනය හා ප්‍රතිකාර කල වෛද්‍යවරයාගේ අත්සන හා නිල මුද්‍රාව සඳහන් විය යුතුය.)

02. රෝහල් ගතව සිටි කාලයට අදාලව වෛද්‍ය නිර්දේශ මත මිලදී ගත් ඖෂධ හෝ වෛද්‍ය පරීක්ෂණවලට අදාල බිල්පත් වල මුල් පිටපත් හා වෛද්‍ය නිර්දේශ.

03. පෞද්ගලික රෝහලක නේවාසික ප්‍රතිකාර ගැනීමක් නම් ඊට අදාලව මුදල් ගෙවන ලද අත්තිකාරම් රිසිට්පත් (Deposit Receipts) විස්තරාත්මක බිල්පත (Final Bill) අවසාන ගෙවීමට අදාලව රිසිට්පත් (Final Cash Payment Receipt)

{ ඉතා වැදගත්: බිල්පත්වල මුල් පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර සහතික කරනලද හෝ වෙනත් බිල්පත් වල ඡායා පිටපත් සඳහා හිමිකම් ගෙවනු නොලැබේ.
වෙනත් ආයතනයකින් මුදලක් ප්‍රතිපූර්ණය කර ඇති විටක ශේෂ සහතිකය ලබාගැනීමේදී මෙම නීතිය අදාල නොවේ. }

04. ඔබගේ බැංකු ගිණුමේ පිටපතක්.

05. විශ්‍රාම වැටුප් කාඩ්පතෙහි පිටපතක්.

06. ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

## වෙනත් උපදෙස්

1. අයදුම්පත රෝහලින් බැරවී දින 90ක් ඇතුලත ජාතික රක්ෂණ භාර අරමුදලවෙත යොමුකල යුතුය.

2. ඔබ විසින් ඉදිරිපත් කරණලද ලිපිලේඛණ වල පිටපත් ග්‍රාමනිළධාරි මගින් පමණක් සහතික කර ඉදිරිපත් කළ යුතුය, දෙපාර්තමේන්තුවේ ප්‍රධානිය විසින් නම් කරණ ලද බලධාරියා ආයතන ප්‍රධානියා ලෙස පිලිගනු ලැබේ.

3. අග්‍රහාර රැකවරණ රක්ෂණ යොජනා ක්‍රමය යටතේ රෝහලක නේවාසිකව ලබාගන්නා ප්‍රතිකාර සඳහා පමනක් ප්‍රතිලාභ ගෙවීම් කරණ.අතර සාමාජිකයාට පමණක් මෙම රක්ෂණ යොජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

4. නිසිපරිදි සම්පූර්ණ කරණලද හිමිකම් අයදුම්පත සමග අවශ්‍ය ලිපිලේඛන එකවර නිවැරදිව ඉදිරිපත් කිරීමෙන් කඩිනමෙන් හා ප්‍රමාදයකින් තොරව හිමිකම් ප්‍රතිලාභ ලබාගත හැකි බව සලකන්න.